# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/01/01/05 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2025.08. 25 |

චක්‍රලේඛ අංක - 06/2024(1)

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>02/2022 චක්‍රලේඛයට සමගාමීව සමූපකාර සේවකයන්ට පොදු දීමනා ක්‍රමවේදයක් හඳුන්වා දීම .</u>**

මෙතෙක් පැවති සමූපකාර සේවක තනතුරු බඳවා ගැනීමේ සුදුසුකම් හා වැටුප් ක්‍රම සංශෝධනය කරමින් නිකුත් කල 02/2022 චක්‍රලේඛය මගින් සමූපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය අරමුණු කර ගන්නා ලදී.

**02.** සමිතිවල මෙතෙක් පැවති වැටුප් ක්‍රම විධිමත් කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරන අවස්ථාවේ එහි 08 වන වගන්තිය මගින් ඒ ඒ සමිතිවල ඉල්ලීම මත සේවකයින්ට පොදුවේ හා පෞද්ගලික වන සේ මේ දක්වා අනුමත කර ඇති සියලු දීමනා අවලංගු කරන ලදී.

**03.** එම තීරණයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ මෙතෙක් ගෙවන ලද දීමනා වැටුපට එක් කර ගැලපෙන අනුරූපී වැටුප් ක්‍රමයක් තෝරාගැනීමට සමිතිවලට අවස්ථාව සැලසීමයි.

**04.** කෙසේ නමුත්, වැටුප් ක්‍රමයක් තෝරාගන්නා අවස්ථාවේ මෙම කොමිෂන් සභාව අපේක්ෂා කළේ මූලික වැටුප ඉහළ යාමත් සමඟ සේවක වැටුප් ඉහල යාමකි. එසේ වුවද, චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර සමිති විසින් ගෙවන ලද ඒකාබද්ධ වැටුපට වඩා අඩු වැටුපක් හිමිවන බවට සමිති හා සේවකයන් රැසක් මෙම කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කර ඇත.

**05.** එම ඉල්ලීම් සියල්ල සලකා බලා, 2022.04.30 දින වන විට ගෙවන ලද ඒකාබද්ධ වැටුපට වඩා මෙම වැටුප් ක්‍රමය හඳුන්වා දීමෙන් පසු අඩු වැටුප් ලබන සේවකයන් සඳහා පමණක් පහත පරිදි කටයුතු කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

- **අ)** 2022.05.01 දිනෙන් පසු නව වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වීමේදී එතෙක් ලැබූ දීමනා අවලංගු වීම මත, ඒකාබද්ධ වැටුප 2022.05.01 දිනට පෙර ලැබූ වැටුපට වඩා අඩු වී ඇත්නම්, එසේ අඩුවී ඇති මුදල පමණක් ගැලපුම් දීමනාවක් ලෙස අදාළ නිලධාරීන්ට ගෙවීම.
- **ආ)** ඉදිරියේදී නව වැටුප් ක්‍රමයක් තෝරා ගැනීමේදී අදාළ වැටුප් හා දීමනා ආවරණය වන වැටුප් ක්‍රමයක් තෝරා ගැනීමට අදාල සමිති කටයුතු කල යුතුය.




ලේකම් / செயலாளர் / Secretary } 091-2232794 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

06. එසේම, තම සමිතියේ මූල්‍ය ශක්‍යතාවය මත, සමිතියේ වැටුප් ක්‍රමය පදනම් කර ගනිමින් පහත සඳහන් දීමනාවන් ඉක්මවා නොයන පරිදි, තම සේවකයින්ට දීමනා ගෙවීම් කළ හැකිය.

අ) මෙහි 06 සිට 07 දක්වා වූ දීමනා සේවක අර්ථසාධක අරමුදලට, සේවක භාරකර අරමුදලට, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා පාරිතෝෂික ගණනය සඳහා අදාළ කර නොගත යුතුය.

ආ) මෙහි සඳහන් දීමනා ගෙවීම හෝ නොගෙවීම, ගෙවන ප්‍රමාණය, තෝරාගනු දීමනා වර්ග යන සියල්ල සමිතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය, සමිතියේ ලාභය යන කරුණු අනුව තීරණය කිරීමේ සම්පූර්ණ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර, දීමනා ක්‍රමයක් තෝරා ගැනීමේදී සමිතියේ සියලු මට්ටමේ සේවකයින්ට යම් දීමනාවක් හෝ දීමනා ලැබෙන පරිදි, දීමනා තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.

ඇ) එසේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මගින් අනුමත කර ගත් දීමනාව/දීමනා ගෙවීම සම්බන්ධව සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශ ලබා ගැනීම අනිවාර්ය වේ. ඒ අනුව සමුපකාර සංවර්ධන කොමසාරිස් නිර්දේශ සහිතව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**06.1. විධායක දීමනාව**

| වැටුප් ක්‍රමය | වැටුප් කේත අංකය අනුව ගෙවිය හැකි උපරිම සීමාව රු. | | | |
|---|---|---|---|---|
| | **EL 01** | **EL – 02** | **EL -03** | **SUL** |
| SP | 15,000 | 14,000 | 13,000 | 12,000 |
| A | 14,000 | 13,000 | 12,000 | 11,000 |
| B | 13,000 | 12,000 | 11,000 | 10,000 |
| C | 12,000 | 11,000 | 10,000 | 9,000 |
| D | 11,000 | 10,000 | 9,000 | 8,000 |

**06.2 දුරකතන දීමනාව**

| වැටුප් ක්‍රමය | වැටුප් කේත අංකය අනුව ගෙවිය හැකි උපරිම සීමාව රු. | | | |
|---|---|---|---|---|
| | **EL 01** | **EL – 02** | **EL -03** | **SUL** |
| SP | 4,000 | 3,500 | 3,000 | 2,500 |
| A | 3,500 | 3,000 | 2,500 | 2,000 |
| B | 3,000 | 2,500 | 2,000 | 1,500 |
| C | 2,500 | 2,000 | 1,500 | 1,000 |
| D | 2,000 | 1,500 | 1,000 | 750 |

06.2.1. එසේම, මේ වන විටත් සමිතිය විසින් අදාළ නිලධාරියගේ ජංගම දුරකතනය රාජකාරි අවශ්‍යතා සඳහා භාවිතය වෙනුවෙන් යම් ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත්නම් හා එම බිල්පත් සමිතිය විසින් ගෙවනු ලබන්නේ නම් මෙම දීමනාව ගෙවිය නොහැක.

**06.2.2.** ප්‍රාථමික මට්ටමේ සමුපකාර සමිතිවල ඉහළම තනතුර දරණ නිලධාරියා (උදා :- ස.ණ.ස සමිතිවල කළමනාකරු) තම ජංගම දුරකතනය, රාජකාරී අවශ්‍යතා සඳහා භාවිතා කරන්නේ නම්, හා එම භාවිතය වෙනුවෙන් සමිතිය විසින් යම් ක්‍රමවේදයක් හඳුන්වා දී එම බිල්පත් සමිතිය විසින් ගෙවනු නොලබන්නේ නම් රු. **2,000.00** ක උපරිමයකට යටත්ව දුරකතන දීමනාවක් ගෙවිය හැකිය.

**06.3.** විධායක නිලධාරීන් සඳහා වන ප්‍රවාහන දීමනාව සහ ඉන්ධන දීමනාව

| වැටුප් ක්‍රමය | වැටුප් කේත අංකය අනුව ගෙවිය හැකි ප්‍රවාහන දීමනාවේ උපරිම සීමාව රු. | | |
|---|---|---|---|
| | **EL 01** | **EL – 02** | **EL - 03** |
| SP | 15,000 | 12,000 | 10,000 |
| A | 12,500 | 10,000 | 8,000 |
| B | 10,000 | 7,000 | 6,000 |
| C | 8,000 | 5,000 | 4,000 |
| D | 7,500 | 4,000 | 3,500 |

**06.3.1.** රාජකාරිය සඳහා තම පෞද්ගලික වාහනය විධිමත් අනුමැතියක් සහිතව රාජකාරිය සඳහා භාවිතා කරන නිලධාරීන්ට ප්‍රවාහන දීමනාව ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබා ගන්නේ නම්, රාජකාරී කටයුතු සඳහා සමිතියේ වාහන භාවිතා නොකළ යුතුය.

**06.3.2.** රාජකාරී කටයුතු සඳහා නිල වාහනයක් සමිතිය මගින් ලබා දී ඇති හෝ තම පුද්ගලික වාහනය රාජකාරී කටයුතු සඳහා විධිමත් අනුමැතියක් සහිතව භාවිතා කරන **EL 01 , EL – 02** හා **EL – 03** මට්ටමේ නිලධාරීන්ට පිළිවෙලින් ඉන්ධන ලීටර් 50, 40 හා 30 යන උපරිම සීමාවට යටත්ව මාසික දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනා ගෙවීමේදී එක් එක් මාසයෙහි ආරම්භක දිනයෙහි වෙළඳපොලහි ඉන්ධන ලීටරයක පවතින මිල පදනම් කරගෙන අදාළ මාසික දීමනාව ගණනය කළ යුතුය.

**<u>06.4. පැමිණීමේ දීමනා</u>**

| වැටුප් ක්‍රමය | වැටුප් කේත අංකය අනුව ගෙවිය හැකි උපරිම සීමාව රු. | | | | |
|---|---|---|---|---|---|
| | **OPL -01** | **OPL – 02** | **MSL - 01** | **MSL - 02** | **MSL - 03** |
| SP | 9,000 | 8,000 | 7,000 | 6,000 | 5,000 |
| A | 8,500 | 7,500 | 6,500 | 5,500 | 4,500 |
| B | 8,000 | 7,000 | 6,000 | 5,000 | 4,000 |
| C | 7,500 | 6,500 | 5,500 | 4,500 | 3,500 |
| D | 7,000 | 6,000 | 5,000 | 4,000 | 3,000 |

**06.4.1.** අදාළ මාසයේ සේවය කිරීමට නියමිත දිනවලින් එක් දිනක් පමණක් සේවයට නොපැමිණි සේවකයින්ට මෙම දීමනාවෙන් 100% ගෙවනු ලැබේ.
**06.4.2.** අදාළ මාසයේ සේවය කිරීමට නියමිත දිනවලින් 1 ½ ක් දක්වා සේවයට නොපැමිණි සේවකයින්ට මෙම දීමනාවෙන් 50% ගෙවනු ලැබේ.
**06.4.3.** අදාළ මාසයේ සේවය කිරීමට නියමිත දිනවලින් දින 1 ½ කට වඩා වැඩි දින ගණනක් සේවයට නොපැමිණි සේවකයින්ට මෙම දීමනාව ගෙවනු නොලැබේ.

## 06.5. කාර්ය සාධන දීමනාව

සමිතිය වාර්ෂිකව ලාභ ලබන අවස්ථාවන්හි එකී ලාභය මත සමුපකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගන්නා පිළිගත හැකි කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් මත සමිතියේ සේවකයින්ට සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ අනුමැතිය මත කාර්ය සාධන දීමනාවක් ගෙවිය හැකිය. එම දීමනාව එක් එක් වර්ෂයේ සමිතිය ලබන ලාභය මත තීරණය විය යුතුය.

## 06.6. අවදානම් දීමනාව

මෙහෙයුම් මට්ටමේ තනතුරුවල සේවයේ නියුතු **OPL - 1** හා **OPL - 2** මූලාමය අවධානම් දරන සේවකයින් සඳහා රු.5,000.00 ක උපරිමයකට යටත්ව අවදානම් දීමනාවක් ගෙවිය හැකිය.

## 06.7. වෘත්තීය දීමනා - රෝහල් සමුපකාර සමිති

රෝහල් සමුපකාර සමතිවල **සෞඛ්‍ය වෘත්තිකයින්** මෙම සේවාවන්හි රඳවා ගැනීමේ අරමුණින් **සෞඛ්‍ය වෘත්තිකයින් සඳහා පමණක්** පහත උපරිමයකට යටත්ව වෘත්තීය දීමනාවක් ගෙවිය හැකිය.

| වැටුප් ක්‍රමය | වැටුප් කේත අංකය අනුව ගෙවිය හැකි උපරිම සීමාව රු. | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **EL - 01** | **EL - 02** | **EL - 03** | **SUL** | **OPL 1** | **OPL 2** | **MSL 1** | **MSL 2** | **MSL 3** |
| SP | 150,000 | 140,000 | 75,000 | 50,000 | 20,000 | 15,000 | 10,000 | 7,500 | 5,000 |
| A | 140,000 | 130,000 | 60,000 | 40,000 | 15,000 | 10,000 | 7,500 | 5,000 | 4,000 |
| B | 120,000 | 100,000 | 50,000 | 30,000 | 10,000 | 7,500 | 5,000 | 4,000 | 3,000 |
| C | 100,000 | 80,000 | 40,000 | 25,000 | 8,000 | 6,000 | 4,500 | 3,500 | 2,500 |
| D | 80,000 | 70,000 | 30,000 | 20,000 | 7,000 | 5,000 | 3,500 | 2,500 | 2,000 |

## 06.8. වෘත්තීය දීමනා - තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ යෙදෙන සමුපකාර සමිති

සමුපකාර සමිතිවල **තේ නිපදවීමේ කටයුතුවල නියුතු වෘත්තිකයින්** මෙම සේවාවන්හි රඳවා ගැනීමේ අරමුණින් **තේ නිපදවීමේ කාර්යයෙහි සෘජුව නියුතු වෘත්තිකයින් සඳහා පමණක්** පහත උපරිමයකට යටත්ව වෘත්තීය දීමනාවක් ගෙවිය හැකිය.

| වැටුප් ක්‍රමය | වැටුප් කේත අංකය අනුව ගෙවිය හැකි උපරිම සීමාව රු. | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **EL - 01** | **EL - 02** | **EL - 03** | **SUL** | **OPL 1** | **OPL 2** | **MSL 1** | **MSL 2** | **MSL 3** |
| SP | 70,000 | 50,000 | 40,000 | 25,000 | 20,000 | 15,000 | 10,000 | 8,000 | 7,000 |
| A | 60,000 | 40,000 | 30,000 | 20,000 | 15,000 | 10,000 | 8,000 | 7,000 | 6,000 |
| B | 50,000 | 35,000 | 25,000 | 15,000 | 10,000 | 8,000 | 7,000 | 6,000 | 5,000 |
| C | 40,000 | 30,000 | 20,000 | 10,000 | 8,000 | 7,000 | 6,000 | 5,000 | 4,000 |
| D | 30,000 | 25,000 | 15,000 | 8,000 | 7,000 | 6,000 | 5000 | 4,000 | 3,000 |

07. <u>යතුරු පැදි දීමනාව</u>

**07.1.** 2022.04.27 දිනැති 02/2022 චක්‍රලේඛයේ 20 වන වගන්තිය අනුව, රාජකාරී කටයුතු සඳහා යතුරු පැදියෙන් යාමට සමිතිය විසින් අවසර දී ඇති අධීක්ෂණ මට්ටමේ සහ මෙහෙයුම් මට්ටමේ නිලධාරීන්ට කිලෝමීටරයකට රු15.00 ක්ව පැවති දීමනාව රු.20.00 ලෙස සංශෝධනය කරනු ලැබේ. එසේම එක් එක් නිලධාරී කාණ්ඩයට ගෙවනු ලබන ඉන්ධන දීමනාවේ උපරිමය, අදාළ නිලධාරී කාණ්ඩයේ රාජකාරී ස්වභාවය, රාජකාරිය සඳහා යා යුතු දුර ප්‍රමාණය අදිය සැළකිල්ලට ගෙන සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

**07.2.** මෙම දීමනාව 02/2022 චක්‍රලේඛයේ 20 වන වගන්තිය සංශෝධනයක් පමණක් වන අතර, මේ වන විටත්, අදාළ චක්‍රලේඛය පරිදි ගෙවීම් කරනු ලබන සමුපකාර සේවකයින්ට, සමුපකාර සංවර්ධන කොමසාරිස් නිර්දේශ හා කොමිෂන් සභා අනුමැතියකින් තොරව ගෙවන දීමනාව සංශෝධනය කර, ගෙවීම් කල හැකිය.

**08.** ඉහත 06 හි සඳහන් සියලුම දීමනා අනුමත කර ගැනීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

**අ)** එක් එක් දීමනා අතරින් කුමන දීමනාව/දීමනා තම සමිතියට අදාළ කරගත යුතු ද යන්න සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම.

**ආ)** එක් එක් දීමනාව සම්බන්ධව මෙම චක්‍රලේඛයේ දක්වා ඇති උපරිම සීමාව දක්වා සමිතියේ මූල්‍ය ශක්‍යතාවය මත සමිතිය විසින් ගෙවනු ලබන සීමාව සම්බන්ධව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම.

**ඇ)** එසේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහිතව අවශ්‍ය කරන වාර්තා ඇතුලත් කර, අදාළ ඉල්ලීම නිර්දේශ සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශට යොමු කිරීම.

**ඈ)** සමිතිය විසින් තීරණය කර ඇති දීමනාව/දීමනා ගෙවීම සම්බන්ධව සමිතියට මූල්‍ය ශක්‍යතාවයන් පවතීද නැද්ද යන්න සම්බන්ධව සමුපකාර සංවර්ධන කොමසාරිස් නිර්දේශ මෙම කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

**ඉ)** අදාළ නිර්දේශ මත ඉල්ලා සිටින දීමනාව/දීමනා සම්බන්ධව කොමිෂන් සභාවට යොමු කර, අදාළ තීරණය සමිතියට දන්වා යැවීම.

**09**. ඉහත **06** වගන්තියෙහි සඳහන් දීමනා ගෙවීම/නොගෙවීම සම්බන්ධව තීරණය කළ යුත්තේ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, මෙහි සඳහන් දීමනා අනිවාර්යයෙන් ගෙවිය යුතු බවක්, මෙම චක්‍රලේඛයේ විධිවිධාන මගින් අදහස් නොවේ. සමිතියේ මූල්‍ය ශක්‍යතාවය සළකා සමිතියේ මූල්‍ය කළමනාකරණයේ දී අගතියක් නොවන පරිදි අදාළ දීමනා අතරින් කවර දීමනා කොපමණ ප්‍රමාණයකින් ගෙවනවාද යන්න තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර, එම දීමනා කාලානුරූපීව සංශෝධනය කිරීමේ හා නතර කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන බවත් කාරුණිකව දන්වා සිටිමි.

**10.** ඒ අනුව 2024/07/02 දිනැතිව මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ 06/2024 මෙයින් අවලංගු කරනු ලැබේ.

**11.** 2024/02/26 දිනැති සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍ර ලේඛඅංක 01/2022 (I) හි සඳහන් ජීවන වියදම් දීමනාව ජාතික අවම වේතනය සංශෝධනයට සමගාමීව පහත අයුරින් සංශෝධනය කරනු ලැබේ.

| දීමනා වර්ගය | 01/2022 (I) අනුව අනුමත දීමනාව | සංශෝධිත දීමනාව ගෙවීම | |
|---|---|---|---|
| | | **2025/04/01 දින සිට** | **2026/01/01 දින සිට** |
| ජීවන වියදම් දීමනාව | රු.2,500/- | රු.6,500/- | රු.9,500/- |
| අතිරේක දීමනාව | රු.7,500/- | රු.7,500/- | රු.7,500/- |

ඒ අනුව,

- 2025/04/01 දින සිට සෑම සේවකයෙකුටම ජීවන වියදම් දීමනාව ලෙස රු.6,500/-ක් ගෙවිය යුතුය.
- 2026/01/01 දින සිට සෑම සේවකයෙකුටම ජීවන වියදම් දීමනාව ලෙස රු.9,500/-ක් ගෙවිය යුතුය.

**11.1.** 2025/04/01 සිට ගෙවිය යුතු හිඟ මුදල් සමාන වාරික වලින් 2025/12/31 වන විට ගෙවා අවසන් කල යුතුය

**12.** මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ අංක DCDSP/02/05/CEC සහ 2025.08.23 දිනැති ලිපිය මගින් ලබා දුන් එකඟතාවය මත 2025.08.25 දින පැවති අතිරේක කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

බෙනිකා ආර්. ජයසේකර,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

බෙනිකා ආර්. ජයසේකර
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව.
දකුණු පළාත.

පිටපත්:

1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ......... සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.

2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු. සමු.සං.ප්‍රා.නි. හරහා අදාළ සමිති දැනුවත් කිරීම සඳහා

3. CEC/03විෂය ගොනුවට